**2017 මාර්තු 12**

**<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය යළි පණගැන්වීම : සිවිල් සමාජය නිකුත් කළ ප්‍රකාශනයක්</u>**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයේ විවාදයක් සඳහා යොමු කිරීම පසුගිය ජනවාරි මාසයේ දී දින නියමයකින් තොරව කල් යාමත් සමගම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ විෂයික කතාබහ ප්‍රායෝගික වශයෙන් ගත් කළ අත්හිටුවී දැනට මාස දෙකකට අධික කාලයක් ගත වී තිබේ. 2015 වසර පුරාවට මේ සම්බන්ධයෙන් සැලකිය යුතු වැඩ කොටසක් ඉටු කොට හමාර වී තිබිණි. මහජන නියෝජිත කමිටුවේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයේ උප කමිටු සහ මෙහෙයුම් කමිටුවේ කාර්යභාරයන් ඊට ඇතුළත් වේ. එහෙත්, 2017 වසරේ මුල් කාර්තුව තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංකරණයකට අදාළ කිසිදු ප්‍රගතියක් අප ලබා නොමැති බව විශාල කනස්සලු සහගත බවක් සනිටුහන් කරයි.

2015 දී එතෙක් පැවැති ආණ්ඩුව වෙනස් කොට ජාතික සමගිය වෙනුවෙන් කැප වන බවට පොරොන්දු දුන් ආණ්ඩුවක් බලයට ගෙන ඒම සඳහා වූ ප්‍රධානතම තාර්කිකය නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයයි. පාර්ලිමේන්තු නියෝජිතයින් දැනට බෙදී ගොස් ඇති ආකාරයද දීර්ඝ කාලීන අවශ්‍යතාවක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිංස්කරණයක් ගෙන ඒම සඳහා අවශ්‍ය දේශපාලනික සම්මුතිය බිහි කිරීමේදී අතිශයින් යෝග්‍ය ආකාරයකින් වෙයි. මෙම හේතූන් දෙකම නිසා තවමත් පවතින එහෙත් බලා සිටියදී වියැකෙමින් පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අවස්ථාව විනාශ කිරීම නියත වශයෙන්ම ඓතිහාසික වැරැද්දක් වනු ඇත. මෙය මේ මොහොතේ අප විසින් අහිමි කර ගන්නේ නම් තවත් පරම්පරාවකටවත් විධායක ජනාධිපති ක්‍රමයේ ඒකාධිකාරිය අවම කිරීමටත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අයිතිවාසිකම් හා නිදහස සවිමත් කිරීමටත්, පුරවැසි නිදහස තහවුරු කරමින් පාර්ලිමේන්තුවේ භූමිකාව ඉහල නැංවීමටත් තවත් එවැනි අවස්ථාවක් උදා නොවනු ඇත.

ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය හා සංහිඳියාව සහතික කරන පාලන තන්ත්‍රයක් බිහි කර ගැනීමට නම් මෙලෙස යෝජනා වී ඇති ප්‍රතිසංස්කරණයන් සිදු කිරීම දැඩි අවශ්‍යතාවකි. ශක්තිමත්,  ස්ථාවර හා සාමකාමී ශ්‍රී ලංකාවක් උදෙසා නැවත පදනමක් සකස් කර ගැනීමට එය මහෝපකාරී වනු ඇත. මෙම මූලික ප්‍රතිසංස්කරණ සඳහා අපට නව ව්‍යවස්ථාවක් අවශ්‍ය වන බව පැහැදිලිය. කලින් කල සිදු කරනු ලබන කුඩා වෙනස්කම් ඒ සඳහා කිසිසේත්ම ප්‍රමාණවත් නැත. එසේම, එවැන්නක් ගෙන ඒමට නම් ආණ්ඩුව සඳහාද එහිම පැවැත්ම පිණිස ජනමත විචාරණයක් අවශ්‍ය වෙයි. එමගින්ම මෙම කර්තව්‍යයේ පරිමාණය අවධාරණය කෙරේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණයක් සිදු කිරීම පහසු කර්තව්‍යයක් බව අප කල්පනා කරන්නේ නැත. සෑම පාර්ශ්වයකම සහයෝගය මෙන්ම ලෝකයේ ඉහලම කැමැත්ත සහිතව වුවද ව්‍යවස්ථා ප්‍රතිස්ංස්කරණයක් සිදු කරන්නේ නම් එහිදී දුෂ්කර ප්‍රශ්න සහ මතභේද සමග ගනුදෙනු කරන්නට සිදු වීම නොවැළැක්විය හැකි තත්ත්වයක් බව සත්‍යයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩල ක්‍රියාදාමයේ සාකච්ඡා වාරයන් නැවැත ඇරඹීම සඳහා දැඩි උත්සාහයක් දරන්නට සිදු වන්නේ එබැවිනි. ජනාධිපතිතුමා සහ අගමැතිතුමා මෙම කාර්යය සඳහා අනිවාර්ය නායකත්වයක් ලබා දිය යුතුය. එහි පළමු පියවරක් වශයෙන් ඔවුන් සිදු කළ යුත්තේ නව ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට උපදෙස් ලබා දෙන පරිදි ඉහත අතුරු වාර්තාව සම්පූර්ණ කිරීමට පියවර ගැනීමයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලය තුළ විවාදයට ලක් කොට එය අනුමත කර ගැනීමෙන් අනතුරුව නව ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ දුෂ්කර අභ්‍යාසය ඇරඹිය හැකි වනු ඇත.

මෙම කාර්යයට අදාළ නිල කටයුතු නැවත ආරම්භ කිරීමට සමගාමීව ආණ්ඩුවේ කඩිනම් අවධානය යොමු විය යුතු තවත් කරුණු කිහිපයක්ම තිබේ. ඒ අතරින් ඉතාම වැදගත් කරුණක් නම් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට අදාළ දේශපාලනික සන්නිවේදන උපායමාර්ගයක් දියත් කිරීමයි. මෑතකාලීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ සැබැවින්ම සිදු වන්නේ කුමක්ද යන්න ගැන අවබෝධයක් ශ්‍රී ලාංකික අති බහුතර පුරවැසියන් අතර නැති බව ඉතාම පැහැදිලිය. සිදුවන්නේ කුමක්ද යන්න ගැන ක්‍රියාවලිය හා ඍජු ලෙස සම්බන්ධව සිටින අයගෙන් ඔබ්බට වන, ජන්දයෙන් තේරීපත් වූ ඇතැම් දේශපාලඥයන් පවා කොපමණ දැනුවත්ද යන්න අපහැදිලිය. මෙම කාර්යය කෙරෙහි මහජන විරෝධයක් ගොඩ නැගීමටත්, ඊට එරෙහි ව්‍යාපාර දියත් වීමටත් බලපාන්නේද එම තත්ත්වයයි. මෙම බලවේගයන් නැවත කණ්ඩායම් ලෙස සංවිධානය වෙමින් පවතින බව දැන් බියඑලවනසුළු ලෙස පැහැදිලි වෙමින් පවතී. ඔවුනට ජය ලැබීමට ඉඩදුනහොත් අපරටේ සමාජයීය, දේශපාලනික, ආර්ථික හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ඉදිරි ගමන දශක ගණනාවකට අවහිර කිරීමට ඔවුන් ක්‍රියා කරණු ඇත. රජය ඉක්මන් ක්‍රියාකාරීත්වයකට එළඹිය යුතු අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ජනමත විචාරණයකට සුදුසු තත්වයන් සහතික කර ගැනීමෙහිලා මුල පිරුම අත් කර ගත යුතුය.

තමන් නියෝජනය කරන දේශපාලන පක්ෂ හා බලවේග ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට මුළුමනින්ම සහාය දක්වන බව සහතික කිරීම ජනාධිපතිතුමාගේත් අගමැතිතුමාගේත් වගකීමකි. මේ අතරම, රජයේ පාර්ශවකරුවන් සියලූ දෙනාම මෙම කාරණය සම්බන්ධයෙන් එක මතයක් දරන තැනට ගෙන ඒමද ඔවුන්ගේ වගකීමකි. අඩුම තරමින් නව ව්‍යවස්ථාවක් හඳුන්වාදීමේ ඓතිහාසික කර්තව්‍යය ඉටුවන තුරුවත් ඔවුන් ජාතික සමගි රජයක් වශයෙන් ක්‍රියා කළ යුතුය. 2015 ජනාධිපතිවරණයේදී වත්මන් ආණ්ඩුව වෙත සිවිල් සමාජ සහයෝගය හිමි වූයේද ඉහත කී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන් හඳුන්වාදීමේ පූර්ව කොන්දෙසිය මත බව අමතක කළ නොහැක. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දීම වෙනුවෙන් අපි තවදුරටත් කැප වීමෙන් කටයුතු කරමු. මෙම ක්‍රියාවලිය වෙත ජනපතිතුමා සහ අගමැතිතුමා විසින් අරමුණ, දිශානතිය සහ ඉක්මන් බව පිළිබඳව වූ හැඟීම ඇතුළු කිරීමට ක්‍රියා කිරීම පිණිස දැන් කාලය පැමිණ ඇත.

අත්සන් කළා:

සංවිධාන

1 යුද්ධය බලපෑ කාන්තාවන්ගේ සංවිධානය
2 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
3 අතුරුදහන් වූවන්ගේ පවුල්
4 මානව සංවර්ධන සංවිධානය
5 ජනවාර්ගික අධ්‍යනයන් පිළිබඳව වූ අන්තර්ජාතික මධ්‍යස්ථානය
6 ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ නීතිඥයෝ
7 ජාතික සාම මණ්ඩලය
8 රයිට්ස් නව්
9 රයිට් ටු ලයිෆ් මානව හිමිකම් කේන්ද්‍රය
10 නීති අධ්‍යයනයන් සඳහා වූ දකුණු ආසියානු මධ්‍යස්ථානය
11 ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල්, ශ්‍රී ලංකාව
12 කාන්තාවන්ගේ දේශපාලන ඇකඩමිය

පුද්ගලයන්

1 සේවාර්ජිත මහාචාර්ය අර්ජුන අළුවිහාරේ
2 හිල්මි අහමඩ්
3 ප්‍රශාන් ඩි විසර්
4 විශාකා ධර්මදාස
5 ජයන්ත ධනපාල
6 ෆිලිප් දිසානායක

7 එස්.සී.සී. ඉලංකොවන්
8 බ්‍රිටෝ ප්‍රනාන්දු
9 ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු
10 භවානි ෆොන්සේකා, නීතිඥ
11 නෙලුම් ගමගේ, නීතිඥ
12 ප්‍රියන්ත ගමගේ, නීතිඥ
13 ලුවි ගනේෂදාසන්, නීතිඥ
14 මාරියෝ ගෝමස්
15 සුදර්ශන ගුණවර්ධන, නීතිඥ
16 ලයනල් ගුරුගේ
17 මහාචාර්ය ෆර්සානා හනිෆා
18 සංජන හත්තොටුව
19 චන්ද්‍රා ජයරත්න
20 තිස්ස ජයතිලක
21 මහාචාර්ය චිත්‍රා මෞනගුරු
22 මහාචාර්ය එම්. එස්. මූකයියා
23 ආචාර්ය දේවනේසන් නේසයියා
24 අශෝක ඔබේසේකර
25 මානව විද්‍යා මහාචාර්ය, සේවාර්ජිත, ගනනාත් ඔබේසේකර
26 මහාචාර්ය රංජිනී ඔබේසේකර
27 ජෙහාන් පෙරේරා
28 අචාර්ය උපතිස්ස පෙතියාගොඩ
29 පූජ්‍ය අචාර්ය ජයසිරි පිරිස්
30 මහාචාර්ය ගමීලා සමරසිංහ
31 අචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු
32 පී. පී. සිවප්‍රගාසම්
33 අචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර
34 අචාර්ය ඒ. සී. විශ්වලිංගම්
35 ගාමිණී වියන්ගොඩ
36 ධම්මපාල විජයනන්ද
37 ජේ. සී. වැලිඅමුණ, නීතිඥ
38 අචාර්ය අසංග වැලිකල
39 අචාර්ය ජෝ විලියම්